**දෙවන ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන (අයි-මාර්ග-II) - 2021**

-------------------------------------------------------------------------------

දෙවන ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහනේ (අයි-මාර්ග-II) 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2017 නොවැම්බර් 22 දින එළැඹි අංක 3579 එස්ආර්අයි සහ අංක 3580 එස්ආර්අයි (සීඕඑල්) ණය ගිවිසුම, 2019 නොවැම්බර් 13 දින එළැඹි අංක 3851 එස්ආර්අයි ණය ගිවිසුම, 2021 මැයි 28 දින එළැඹි අංක 4067 එස්ආර්අයි යන ණය ගිවිසුම්වල IV වගන්තියේ 4.03 වගන්තිය සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් සහ වැඩසටහනේ කාලය

-------------------------------------------------------------------------------

වැඩසටහනේ ණය ගිවිසුම්වලට අනුව, එවකට උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය, වර්තමානයේ ප්‍රවාහන සහ මහාමාර්ග අමාත්‍යාංශය වැඩසටහන ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. වැඩසටහනේ අරමුණ වන්නේ, ග්‍රාමීය ප්‍රජාව සහ සමාජ ආර්ථික මධ්‍යස්ථාන අතර මාර්ග ප්‍රවේශතාවය වැඩිදියුණු කිරීමය. මෙහි දිගුකාලීන බලපෑම වන්නේ ජාතික හා පළාත් මාර්ගවල ප්‍රවාහන කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම වේ. ණය ගිවිසුම්වලට අනුව, වැඩසටහනේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 165,185 කට සමාන එ.ජ.ඩො. මිලියන 1,084.60 ක් වන අතර ඉන් රු. මිලියන 137,070 කට සමාන එ.ජ.ඩො. මිලියන 900 ක් මූල්‍යනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟවී තිබුණි. ඉතිරි මුදල රු. මිලියන 28,115 කට සමාන එ.ජ.ඩො. මිලියන 184.6 ක් ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කිරීමට අපේක්ෂිතය. වැඩසටහනේ මූල්‍ය සැලසුම බහු අදියර මූල්‍ය පහසුකම යටතේ අදියර පහකින් සමන්විත අතර 2021 දෙසැම්බර් 31 දින වන විට එ.ජ.ඩො. මිලියන 500 ක් වූ පළමු අදියර තුනෙහි ගිවිසුම් ණය ප්‍රදානකරු සමඟ අත්සන් කර තිබුණි. වැඩසටහන එහි කටයුතු 2018 ජූලි 20 දින ආරම්භ කරන ලද අතර 2027 මාර්තු 31 දින වන විට නිමකිරීමට නියමිතය.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

------------------------------

මාගේ වාර්තාවේ 2.1 වගුවේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2021 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

---------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
වැඩසටහනේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම ඊට සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත්කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී ඊ සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හා වැරදි තනිව හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑම් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය හා වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම්කිරීම පිණිස වැඩසටහනේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත් අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2.** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.1** **ගිණුම්කරණ අඩුපාඩු**

| ගිණුම්කරණ අඩුපාඩු | | වටිනාකම රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ වැඩසටහන රු. 153,280 ක වටිනාකමකින් යුත් දේපල, පිරියත සහ උපකරණ මිලදී ගෙන තිබුණද, වත්කම් ක්ෂයවීම් අගය කාරක ප්‍රාග්ධනයට වෙනම ගැලපීමෙන් තොරව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු. 701,578 ක් ලෙස දක්වා තිබුණි. | 548,298 | එය නිවැරදි කළ යුතු අතර වෙනස කෙරීගෙනයන වැඩ ගිණුමට ගැලපිය යුතුය. | මිලදී ගත් දේපල, පිරියත සහ උපකරණවල තත්‍ය මිලදී ගත් වටිනාකම ආයෝජන ක්‍රියාකාරකම් යටතේ හඳුනාගත යුතුය. |
| (ආ) | AM 4 කොන්ත්‍රාත් පැකේජයේ මිල විචලනයන් සම්බන්ධව 2021 නොවැම්බර් 26 දින කොන්ත්‍රාත්කරුට පක්ෂව ගනු ලැබූ ආරවුල් විනිශ්චය මණ්ඩල තීරණය මත පදනම්ව, වැඩසටහන විසින් 2021 දෙසැම්බර් 15 දින අතෘප්තිකර නිවේදනය (NOD) නිකුත් කර තිබුණි. කෙසේ වෙතත්, අතෘප්තිකර නිවේදන නිකුත් කිරීමෙන් පසු ගෙන තිබුණු ක්‍රියාමාර්ග විගණනයට අනාවරණය වී නොතිබුණු අතර වැඩසටහන විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය අංක 08 ප්‍රකාරව එම අසම්භාව්‍ය වගකීම සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන හෝ හෙළිදරව් කිරීම් සිදු කර නොමැති බව නිරීක්ෂණය විය. | - | ඉදිරි වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශනයේ ප්‍රතිපාදන හෝ හෙළිදරව් කිරීම සිදු කිරීමට සටහන් කර ගතිමි. | මූල්‍ය ප්‍රකාශනවල අසම්භාව්‍ය වගකීම් සඳහා ප්‍රතිපාදන සිදුකිරීමට හෝ හෙළිදරව් කිරීම් සිදුකිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ට පටහැනිව, වසර තුළ මිලදී ගත් වටිනාකම රු. මිලියන 3.2 ක ලැප්ටොප් පරිගණක තුනක් සහ එක් ඩෙස්ක්ටොප් පරිගණකයක් ජංගම නොවන වත්කම් ලෙස සටහන් කර නොතිබුණි. තවද, නිර්මාණ ඉංජිනේරු කටයුතු උපදේශන සේවා සඳහා වැයකල රු. 108,280 ක මුදලක් සාවද්‍ය ලෙස ජංගම නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණි. | රු. මි. 3.1 | එම ගැලපීම් ඉදිරි වසරේ ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය අංක 07 ට අනුකූලව වත්කම් ගිණුම්ගත කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2021 දෙසැම්බර් 31 දිනට කි.මී. 595.66 ක් දිග ග්‍රාමීය මාර්ග 149 ක් සහ කි.මී. 11.61 ක් දිග ජාතික මාර්ග 01 ක් අදාළ ආයතන වෙත භාර දී තිබුණද, ඒ සඳහා වන පිරිවැය ශ්‍රී ලංකා රාජ්‍ය අංශය ගිණුම්කරණ ප්‍රමිත 01 ට අනුකූලව වත්කම් ලෙස හඳුනාගෙන නොතිබුණි. | - | එක් එක් මාර්ගයේ පිරිවැය හඳුනා ගැනීම සඳහා එක් එක් කොන්ත්‍රාත්තුව යටතේ සියලුම මාර්ග අවසන් වන තෙක් සහ කාර්ය සාධනය පදනම් කරගත් නඩත්තු කාල සීමාව අවසන් වන තෙක් වැඩසටහනට රැඳී සිටීමට සිදුවනු ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 ට අනුකූලව මාර්ග පිරිවැය ප්‍රාග්ධනීකරණය කළ යුතුය. |
| (ඉ) | 2021 දෙසැම්බර් මස සඳහා ඌනපූරණය නොකළ හෝ අයකර නොගත් ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ වියදම වූ රු. මිලියන 25 ක් ඌනපූරණ ගිණුමට ගැලපුම් කර නොතිබුණි. එබැවින්, 2021 දෙසැම්බර් 31 දිනට ඌනපූරණ සහ ගෙවිය යුතු ණය එම මුදලින් අඩුවෙන් දක්වා තිබුණි. | රු.මි. 25 | සාවද්‍ය ලෙස ඌනපූරණ සහ ගෙවිය යුතු ණය යටතේ ප්‍රතිපාදන සිදු කර නොමැත. | අදාළ ප්‍රතිපාදන නිවැරදිව සිදුකළ යුතුය. |
| (ඊ) | වැඩසටහනේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂය තුළ විදේශ ණය සඳහා වූ මුළු වියදම රු.මි. 37,316.88 ක් වුවද, ඊට අනුරූප මහා භාණ්ඩාගාරයේ සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අගය පිළිවෙලින් රු. මි. 38,231.71 ක් සහ රු.මි. 37,326.63 ක් ලෙස දක්වා තිබුණි. කෙසේ වෙතත්, මූල්‍ය ප්‍රකාශය සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව අතර වූ රු.මි. 9.75 ක වෙනසට හේතු විගණනය සඳහා හෙළිදරව් කළ නොහැකි විය. | රු.මි. 914.83 ක් සහ රු.මි. 9.75 | මහා භාණ්ඩාගාරයේ හෝ ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර ඇති මුළු වියදම විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ වියදම් විස්තර සමඟ නිවැරදිව සංසන්දනය කිරීම අපහසු වනු ඇත. | අදාළ පාර්ශව සමඟ සාකච්ඡා කර වෙනස්කම් අවම කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**2.2 රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීම**

| අංකය | රීති සහ රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | කොන්ත්‍රාත් විශේෂ කොන්දේසි 14.6 උප වගන්තිය | කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කළ යුතු අතුරු ගෙවීම් සහතිකයේ අවම වටිනාකම එකඟ වූ | කොවිඩ්-19, අමුද්‍රව්‍ය හිඟය වැනි හේතු කොන්ත්‍රාත්කරුවන්ට අමතර පිරිවැයක් ඇති | පිරිවැය, කාලය සහ කොන්ත්‍රාත්කරුවන් සඳහා වන අනවශ්‍ය අනුග්‍රහය අවම කර |

| | | | | |
|---|---|---|---|---|
| | | කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 1.5 කි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළ පැකේජ 49 ක් යටතේ නියමිත සීමාවට වඩා අඩු වූ අතුරු ගෙවීම් සහතික ඇගයීම් කළ අවස්ථා 266 ක් නිරීක්ෂණය විය. | කිරීමට හේතු විය. අප මූලික කොන්දේසි පිළිපැදියහොත් කොන්ත්‍රාත්කරුවන්ගේ මුදල් ප්‍රවාහයට බලපානු ඇති අතර, ඔවුනට කොන්ත්‍රාත් කළමනාකරණය කිරීමට නොහැකි වන අතර කොන්ත්‍රාක් ක්‍රියාත්මක නොවීමට හේතුවනු ඇත. | ගැනීම සඳහා කොන්ත්‍රාත් කොන්දේසිවල නියම කර ඇති සීමාවන් පිළිපැදීම අවශ්‍ය වේ. |
| (ආ) | කොන්ත්‍රාත් පොදු කොන්දේසි 14.7 උප වගන්තිය | සේවා යෝජකයා විසින් එක් එක් අතුරු ගෙවීම් සහතිකවල සහතික කළ අගය දින 56 ක් ඇතුළත ගෙවිය යුතුය. සඳහන් කර ඇති පරිදි ගෙවීම් නොලැබුනේ නම්, කොන්ත්‍රාත්කරුට කොන්තාත්තුවේ කොන්දේසි 14.8 උප වගන්තිය අනුව ප්‍රමාද වූ කාලය තුළ නොගෙවූ මුදල මත මූල්‍ය ගාස්තු ලබා ගැනීමට හිමිකම් ඇත. ඒ අනුව, සමාලෝචිත වර්ෂය තුළ අතුරු ගෙවීම් සහතික 36 ක නියමිත කාලය ඉක්මවා දින 01 සිට 68 දක්වා ප්‍රමාදයන් නිරීක්ෂණය විය. | කොන්ත්‍රාත්කරුගේ ඉදිරිපත් කිරීම්වල යම් ලේඛන විෂමතා සහ අසම්පූර්ණ භාවයක් තිබිය හැකි අතර සමස්ථ අතුරු ගෙවීම් සහතිකයම ආපසු නොයවා ඉංජිනේරුවරයා විසින් අතපසුවූ ලේඛන ඉල්ලා ඇත. මෙම ක්‍රියාවලියේදී, කොන්ත්‍රාත් කොන්දේසිවල සඳහන් නියමිත කාලය ඉක්මවා කාලයක් ගතවනු ඇති අතර එවැනි ප්‍රමාදයක් සඳහා මෙතෙක් කිසිදු කොන්ත්‍රාත්කරුවෙකු පොලී ගෙවීමක් ඉල්ලා නොතිබුණි. | අනවශ්‍ය ගෙවීම් වළක්වා ගැනීම සඳහා සේවායෝජකයා සෑම විටම කොන්ත්‍රාත් කොන්දේසි වලට අනුකූල විය යුතුය. |
| (ඇ) | කොන්ත්‍රාත් පොදු කොන්දේසි 4.2 උප වගන්තිය | කොන්ත්‍රාත්කරුවන් විසින් කාර්ය සාධන සුරක්ෂණ ඔවුන්ගේ වියදමින් ලබා දිය යුතු වුවද, කොන්ත්‍රාත්කරුවන්ට හිමිකම් පෑමට හැකි වන පරිදි මූලික සහ පොදු අයිතම යටතේ වෙනම ගෙවීම් අයිතමයක් ප්‍රමාණ පත්‍රවල සකස් කර ඇති බව නිරීක්ෂණය විය. ඒ අනුව 2021 දෙසැම්බර් 31 දිනට | සිදුකෙරෙමින් පවතින සහ ඉදිරි ප්‍රසම්පාදනයන් වලදී මෙම අයිතමයන් කොන්ත්‍රාත් ප්‍රමාණ පත්‍ර වලින් ඉවත් කරනු ලැබේ. | ලංසු ලියකියවිලි නිකුත් කිරීමට පෙර ප්‍රසම්පාදන විශේෂඥ සහ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ප්‍රමාණ පත්‍ර සමාලෝචනය කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | කාර්ය සාධන සුරක්ෂණ වල පිරිවැය ප්‍රතිපූරණය කිරීම සඳහා ඌව පළාතේ කොන්ත්‍රාත්කරුවන්ට රු.මි. 85.64 ක මුදලක් ගෙවා තිබුණි. | | |
| (ඇ) | කොන්ත්‍රාත් පොදු කොන්දේසි 14.9 උප වගන්තිය. | පවරා ගැනීමේ සහතිකය නිකුත් කිරීමෙන් පසු කොන්ත්‍රාත්කරුට රඳවා ගැනීමේ මුදලින් සියයට 50 ක් ගෙවිය හැකි අතර දෝෂ දැනුම්දීමේ කාල සීමාව අවසන් වීමෙන් පසුව හෝ ඇපකරයක් ලබාදීමෙන් පසුව ඉතිරි සියයට 50 ක මුදල මුදා හැරිය හැක. කෙසේ වෙතත්, පැකේජ සඳහා පවරා ගැනීමේ සහතික නිකුත් කර නොතිබුණද, පැකේජ 06 කට අදාළ සම්පූර්ණ රඳවා ගැනීම් වන රු. 772,656,062 ක් කොන්ත්‍රාත්කරුවන් වෙත මුදා හැර ඇති අවස්ථා නිරීක්ෂණය විය. | කෝවිඩ් සහ වෙනත් ගැටළු හේතුවෙන් ඇති වූ මුදල් ප්‍රවාහ ප්‍රශ්ණ මගහරවා ගැනීම සඳහා බොහෝ කොන්ත්‍රාත්කරුවන් බැංකු ඇපකර මත රඳවා ගැනීමේ මුදල් නිදහස් කරන ලෙස ඉල්ලා ඇත. අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලබාගෙන සම්පූර්ණ රඳවා ගැනීමේ මුදල් නිදහස් කර ඇත. | අපගමන සඳහා නිසි අනුමැතිය ලැබෙන තෙක් කොන්ත්‍රාත්තුවේ කොන්දේසි දැඩි ලෙස අනුගමනය කළ යුතුය. |
| (ඉ) | කොන්ත්‍රාත් පොදු කොන්දේසි 15.3 උප වගන්තිය. | වැඩ අවලංගු කිරීමේ නිවේදනයක් නිකුත් කිරීමෙන් පසු කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු වැඩ, භාණ්ඩ සහ වෙනත් ඕනෑම මුදලක වටිනාකම ඉංජිනේරුවරයා විසින් ප්‍රායෝගිකව හැකි ඉක්මණින් තීරණය කළ යුතු වුවද, ඌව පළාතේ අවලංගු කරන ලද කොන්ත්‍රාත් වැඩ අවලංගු කිරීමේ නිවේදනය නිකුත් කිරීමෙන් පසු 2021 දෙසැම්බර් 31 දිනට මාස 10 කට වැඩි කාලයක් ගතවී | අවලංගු කිරීමේදී නිම කරන ලද වැඩවල වටිනාකම සකස් කිරීම සඳහා ඒකාබද්ධව මිනුම් ලබා ගැනීම අවශ්‍ය වේ. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්කරු එවැනි වැඩ සඳහා ඒකාබද්ධව සහය වීමට නොපැමිණි අතර එබැවින් අවලංගු කිරීමේදී වටිනාකම සකස් කිරීම සඳහා ඉංජිනේරුවරයා විසින් සියලු වැඩ කළ යුතුව ඇත. කෙසේ වෙතත්, මේ වනවිට අවලංගු කිරීමේ අගය ගණනය කිරීම් අවසන් කර | නැවත ලංසු කැඳවීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීමට පෙර අවලංගු කිරීමේ අගය ගණනය කර අවසන් කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | ඇතත් සේවායෝජකයා විසින් එය සිදු කර නොතිබුණි. | ඇති අතර විස්තර ඉදිරිපත් කළ හැකිය. | |
| (ඊ) | 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත | ශ්‍රී ලංකාවේ හඳුනාගත් ඕනෑම ඉදිකිරීම් කටයුත්තක නියැලීමට පෙර සෑම විදේශීය කොන්ත්‍රාත්කරුවෙකුම ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) කොන්ත්‍රාත්කරුවෙකු වශයෙන් තාවකාලික ලියාපදිංචියක් ලබා ගත යුතුය. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්කරුවන් 09 දෙනෙකුට අදාළ කොන්ත්‍රාත් ලබා දීමට පෙර වැඩසටහන විසින් ඉ.ක.ස.අ. ලියාපදිංචිවීමේ අවශ්‍යතාවය සලකා නොතිබුණු බව නිරීක්ෂණය විය. | ඉ.ක.ස.අ. ලියාපදිංචි අවශ්‍යතා ලංසු ප්‍රතික්ෂේප කිරීම සඳහා නිර්ණායකයක් ලෙස සැලකිය නොහැක. | කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීමට පෙර කොන්ත්‍රාත්කරුවන් ප්‍රමිතිකරණය කළ යුතුය. |
| (උ) | 1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් පනත. | රු. මිලියන 5 ට වැඩි වටිනාකමක් ඇති පොදු කොන්ත්‍රාත්වල ලංසුකරුවන් ලංසු තැබීමේ ලියකියවිලි ලබාගැනීමට පෙර පොදු කොන්ත්‍රාත් පනත යටතේ ලියාපදිංචි විය යුතු අතර කොන්ත්‍රාත්තුව පිරිනැමීමෙන් පසු කොන්ත්‍රාත් ලියාපදිංචිය ලබා ගත යුතුය. අදාළ ලංසුකරුවන්ගේ තාක්ෂණික ලංසු ඇගයීමේදී එම අවශ්‍යතාව ව්‍යාපෘතිය විසින් සලකා නොතිබුණු බව නිරීක්ෂණය විය. | ආ.සං.බැ. සාමාජික රටක ලියාපදිංචි වූ කොන්ත්‍රාත් සමාගම් සහ ආ.සං.බැ. විසින් අසාදු ලේඛනගත නොකළ සමාගම් කොන්ත්‍රාත්කරුවන් ලෙස තෝරාගෙන ඇත. | ලංසුකරුවන් සහ ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත්, පොදු කොන්ත්‍රාත් පනත යටතේ ලියාපදිංචි කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඌ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 5.3.7 (ආ) වගන්තිය | බද්ධ ව්‍යාපාරයක් ලෙස ලංසුවක් ඉදිරිපත් කරන බව ප්‍රකාශ කළද, බද්ධ ව්‍යාපාරයේ සියලුම පාර්ශ්ව කොන්ත්‍රාත්තුව යටතේ ඇති වගකීම් ඉටු කිරීම සඳහා ඒකාබද්ධව සහ තනි තනිව වගකිව යුතු අතර ලිඛිත ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුය වුවද, තාක්ෂණික ලංසු සමග කොන්ත්‍රාත්කරුවන් විසින් ලබා දුන් එවැනි ලිඛිත ප්‍රකාශයක් විගණනයට නිරීක්ෂණය නොවුණි. | බද්ධ ව්‍යාපාර ගිවිසුමකදී හෝ බද්ධ ව්‍යාපාරයක් පිහිටුවීමට අදහස් කරන අවස්ථාවකදී සියලුම හවුල්කරුවන් ඒකාබද්ධව සහ තනිව වගකිව යුතු බව ලංසු උපදෙස්වල පැහැදිලිවම නියම කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ දක්වා ඇති කොන්දේසි වලට අනුකූල වියයුතුය. |

**3. භෞතික කාර්ය සාධනය**

**3.1 ව්‍යාපෘති ක්‍රියාකාරකම් වල භෞතික ප්‍රගතිය**

| අංකය | සංරචක | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ජාතික හා ග්‍රාමීය මාර්ගවල මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කර භාරදීම | 2021 අප්‍රේල් මස පහසුකම් පරිපාලන අත්පොතට අනුව වැඩසටහන මගින් උතුරු, නැගෙනහිර, ඌව සහ බස්නාහිර පළාත්වල ජාතික මාර්ග 36 කින් කි.මී. 417.75 ක් සහ ග්‍රාමීය මාර්ග 1349 කින් කි.මී. 3338.87 ක මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීමට අපේක්ෂා කළද, 2021 දෙසැම්බර් 31 දිනට එක් ජාතික මාර්ගයක කි.මී 11.61 ක් සහ ග්‍රාමීය මාර්ග 149 ක කි.මී. 595.66 ක ප්‍රතිසංස්කරණ කටයුතු පමණක් අවසන් කර අදාළ ආයතන වෙත භාර දී තිබුණි. | පහසුකම් පරිපාලන අත්පොත ණය ගිවිසුමේ මුල් අදියරේදී සකස් කර ඇති අතර අපේක්ෂිත දිනයන් ඇස්තමේන්තු පමණි. | වැඩසටහනේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | ජාතික හා ග්‍රාමීය මාර්ගවල මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කිරීම | ඌව පළාතේ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ කොන්ත්‍රාත් වල ආරම්භක දිනය 2018 ජූලි 20 වන අතර මූලික අවසන් කළයුතු දිනය 2020 ජූලි 20 විය. සියලුම කොන්ත්‍රාත්තු පැකේජ 15 ක් යටතේ ක්‍රියාත්මක විය. කොන්ත්‍රාත් වල මුල් අවසන් දිනයේ සිට දින 529 | අධික බෑවුම් සහිත ප්‍රදේශවල ඉදිකිරීම් දුෂ්කර වීම, අයහපත් කාලගුණය සහ කොවිඩ් 19 වසංගත තත්ත්වය මෙම ප්‍රගතියට හේතු වී ඇත. | වැඩසටහනේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා සියලු උත්සාහයන් ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | ක් ඉකුත්ව ඇතත්, සමස්ථ මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු කි.මී. 1012.89 කින් කි.මී. 650.86 ක දිගකින් යුත් කොන්ත්‍රාත් කටයුතු පමණක් 2021 දෙසැම්බර් 31 දින වනවිට අවසන් කර තිබුණි. තවද, ග්‍රාමීය මාර්ග 249 න් මාර්ග 110 ක් පමණක් 2021 දෙසැම්බර් 31 වන විට නිම කර තිබුණි. | | |
| (ඇ) | ජාතික හා ග්‍රාමීය මාර්ගවල මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කිරීම | නැගෙනහිර පළාතේ ග්‍රාමීය මාර්ගවල මාර්ග ප්‍රතිසංස්කරණ කොන්ත්‍රාත් වල ආරම්භක දිනය 2019 සැප්තැම්බර් 24 දින වන අතර මූලික අවසන් දිනය 2021 සැප්තැම්බර් 24 දින විය. මුලින් නිම කළයුතු දින සිට දින 98 ක් ගතවී ඇතත්, පුනරුත්ථාපන කටයුතුවල මුළු දිග කි.මී.795 කින් කොන්ත්‍රාත්කරුවන් විසින් නිම කර තිබුණේ කි.මී. 518 ක් පමණි. කෙසේ වෙතත්, 2021 දෙසැම්බර් 31 වන විට මාර්ග 370 කින් මාර්ග 34 ක් පමණක් මාර්ග සංවර්ධන අධිකාරියට පවරා දී තිබුණි. | ඉදිකිරීම් 2019 අවසානයේ ප්‍රදානය කරන ලද අතර කොවිඩ් වසංගතය ඉදිකිරීම් කටයුතුවලට දැඩි ලෙස බලපාන ලදී. | වැඩසටහනේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා සියලු උත්සාහයන් ගත යුතුය. |

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 2.4 සහ 2.6 උප වගන්තියට අනුව, ඉංජිනේරු ඇස්තමේන්තු, ලංසු ලේඛන සහ ප්‍රමාණ පත්‍ර ප්‍රසම්පාදන කමිටුව සහ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නිසි ලෙස ඇගයීමට ලක් කළ යුතු වුවද, ඉංජිනේරු ඇස්තමේන්තු, ලංසු ලේඛන සහ ප්‍රමාණ පත්‍රවල අනුපාත විෂමතා සහ අයිතම වැරදි ලෙස අර්ථකථනය කිරීම හේතුවෙන් BA 4 සහ BA 5 කොන්ත්‍රාත් පැකේජ සම්බන්ධයෙන් 2021 දෙසැම්බර් 31 දිනට වැඩසටහනට රු. මි. 48.2 ක පාඩුවක් සිදුවී තිබුණි. | BA 4 සහ BA 5 කොන්ත්‍රාත්වල ඇගයීම් කළ ලංසු මිල සාධාරණ බව අනාවරණය විය. අ.ම.ප.ස්.ප්‍ර.ක. සහ තා.ඇ.ක. විසින් ආ.සං.බැ. හි ඇගයීම් මාර්ගෝපදේශවල කොන්දේසි මත ලංසු ඇගයීම සිදුකර ඇත. | පාඩුව අයකර ගැනීමට වැඩසටහන විසින් කඩිනමින් පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කොන්ත්‍රාත් කොන්දේසිවල උප වගන්ති 108.4 සහ 120.7 අනුව වැඩසටහන අවසානයේ සියලුම රසායනාගාර, ගෘහ භාණ්ඩ සහ මිනින්දෝරු උපකරණ කොන්ත්‍රාත්කරු වෙත ආපසු ලබා දෙනු ලැබුවද, රසායනාගාර, ගෘහ භාණ්ඩ සහ මිනින්දෝරු උපකරණ සඳහා පිළිවෙලින් රු. මිලියන 932.98 ක් සහ රු. මිලියන 16.23 ක් එකවර ගෙවීමක් ලෙස 2021 දෙසැම්බර් 31 දිනට ගෙවා තිබුණි. මේ අනුව අසාමාන්‍ය කොන්ත්‍රාත් කොන්දේසි කොන්ත්‍රාත්කරුවන්ට අනවශ්‍ය ප්‍රතිලාභ ලබා දීමට හේතු වනු ඇති බවට නිරීක්ෂණය විය. | මාර්ග සංවර්ධන අධිකාරියට ගෘහ භාණ්ඩ, විද්‍යාගාර සහ මිනින්දෝරු උපකරණ අවශ්‍ය නම් එම තත්ත්වයට ගැලපෙන පරිදි මෙම කොන්දේසි ඉදිරියේදී සංශෝධනය කරනු ඇත. තවද, මෙම අයිතම වසර 2-3 කට වඩා වැඩි කාලයක් භාවිතා කිරීමෙන් පසුව, කොන්ත්‍රාත්තුව අවසානයේ බොහෝ විට භාවිතා කළ නොහැකි හෝ යල් පැන ගිය තත්වයේ පවතී. | සාමාන්‍යයෙන් අදාළ වත්කම් සේවා යෝජකයා විසින් රඳවා ගනු ලැබේ. එබැවින්, මෙම වැඩසටහන යටතේ කොන්ත්‍රාත් පිරිවැය, වෙනත් අරමුදල් සපයන ව්‍යාපෘති විසින් පිරිනමනු ලබන කොන්ත්‍රාත් පැකේජවල පිරිවැය සමඟ සසඳන විට අඩු කිරීම අවශ්‍ය වනු ඇත. |
| (ඇ) | මාර්ග ප්‍රතිසංස්කරණ ප්‍රගතියට ඇතුළත් කර ඇති නැගෙනහිර පළාතේ අලුතින් එක් කළ මාර්ග 06 ක් පහසුකම් පරිපාලන අත්පොතෙහි හෝ තෝරාගත් කොන්ත්‍රාත්කරුවන් වෙත ලබා දී ඇති අදාළ කොන්ත්‍රාත් පැකේජ යටතේ ඇතුළත් කර නොතිබුණි. තවද, 2021 දෙසැම්බර් 31 දින වන විටත් එම ඉදිකිරීම් සඳහා වැඩසටහන මගින් ආ.සං.බැ. සහ ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ එකඟතාවයන් ලබාගෙන නොතිබුණි. | අනුමැතිය සඳහා අවශ්‍ය ලියකියවිලි ඉදිරිපත් කර ඇත. | විෂය පථය වෙනස් කළ යුත්තේ ණය දෙන ආයතනයේ සහ ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ එකඟතාවයෙන් පසුව පමණි. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අවලංගු කරන ලද කොන්ත්‍රාත් පැකේජ 03 කට අදාළ රු. මි. 690.74 ක කාර්ය සාධන ඇපකර මුදල් අය කිරීමට වැඩසටහන මගින් ක්‍රියා කර නොතිබුණි. | ඇපකර මුදල් අය කිරීම වැළැක්වීම සඳහා කොන්ත්‍රාත්කරුවන් අධිකරණ නියෝග ලබාගෙන තිබූ අතර නඩු කටයුතු සිදු වෙමින් පවතී. | කොන්ත්‍රාත් කොන්දේසි වල දක්වා ඇති පරිදි කාර්ය සාධන ඇපකර මුදල් කරගත යුතුය. |
| (ඉ) | අවලංගු කළ කොන්ත්‍රාත්තුවලට අදාළව වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ආපසු අයකර ගැනීමට සහ ණය නියෝජිතායතනයට ආපසු ගෙවන ලෙසට ණය දෙන ආයතනය උපදෙස් දී තිබුණද, ඌව පළාතේ අවලංගු කළ කොන්ත්‍රාත් පැකේජ 03 කට අදාළව තවදුරටත් අයවී නොතිබුණු රු. මිලියන 560.14 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල අය කර ගැනීමට ව්‍යාපෘතිය අපොහොසත් වී | අත්තිකාරම් ඇපකර මුදල් කර ගැනීම වැළැක්වීම සඳහා කොන්ත්‍රාත්කරු අධිකරණ නියෝග ලබාගෙන ඇති අතර නඩු විභාග වෙමින් පවතී. එබැවින් අවලංගු කිරීම සම්බන්ධ මුදල් හා අය කිරීම් සිදුකර අවසන් කළ හැක්කේ නඩු කටයුතු අවසන් වූ පසුව පමණි. | අත්තිකාරම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තිබුණි. ඒ අනුව, 2021 දෙසැම්බර් 31 දිනට අයකර නොගත් මුළු වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් රු. මිලියන 13,922.63 ක් විය. | | |
| (ඊ) | 2021 දෙසැම්බර් 31 වන විට දැනටමත් ප්‍රදානය කර තිබූ නැවත ලංසු කැඳවූ කොන්ත්‍රාත් පැකේජ හතෙහි ඉංජිනේරු ඇස්තමේන්තුවට සාපේක්ෂව කොන්ත්‍රාත් වටිනාකම්වල ශුද්ධ අගය වැඩිවීම සියයට 10.33 සිට සියයට 33.21 දක්වා පරාසයක පැවතුනි. | ඉංජිනේරු ඇස්තමේන්තුව ම.ප්‍ර.රේ. භාවිතයෙන් සකස් කර ඇති අතර ග්‍රාමීය මාර්ග පිරිවැය ඇස්තමේන්තු කිරීම සඳහා යෙදවීම ප්‍රායෝගික නොවේ. එබැවින් සම්මතයන් ඒ අනුව වෙනස් විය යුතුය. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ දක්වා ඇති කොන්දේසි අනුව ඉංජිනේරු ඇස්තමේන්තු යථාර්ථවාදී විය යුතුය. |
| (උ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ සම්මත ලංසු ලේඛනවලට පටහැනිව අවම ප්‍රතිචාරාත්මක ලංසුකරුට කොන්ත්‍රාත් එකකට වඩා වැඩි ප්‍රමාණයකට ඉඩ දීමට නොහැකි වන පරිදි ලංසු ලේඛනවල 03 වැනි කොටසේ 1.6 යටතේ විශේෂ වගන්තියක් ඇතුළත් කර තිබුණි. එබැවින් අවම ප්‍රතිචාරාත්මක ලංසුකරුවෙකුට එක් කොන්ත්‍රාත් පැකේජයකට වඩා ප්‍රදානය කිරීමට නොහැකි විය. ප්‍රදානය කරන ලද පැකේජ වලින් පමණක් වැඩසටහනට රු. මිලියන 66,751,961 ක අතිරේක මුදලක් වැයවී තිබුණු බව නිරීක්ෂණය විය. | කොන්ත්‍රාත්තු කිහිපයක් ලබා දී ඇති අක්‍රිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ අත්දැකීම් ව්‍යාපෘතියට ඇත. තවද, මේවා දැනටමත් එක්වරක් අවලංගු කර තිබුණු පැකේජ වන අතර අවසන් කිරීම ප්‍රමාද වීම මහජන පැමිණිලි ඇතිවීමට තුඩු දෙනු ඇත. එබැවින් සෑම කොන්ත්‍රාත්කරුවෙකුටම එක් කොන්ත්‍රාත් පැකේජයක් බැගින් පමණක් ප්‍රදානය කිරීමට නැඹුරු විය. | වැඩසටහනට ඇතිවන ආර්ථික නොවන පිරිවැය අවම කිරීම සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ දක්වා ඇති කොන්දේසි දැඩි ලෙස අනුගමනය කළ යුතුය. |
| (ඌ) | නැවත ලංසු කැඳවූ කොන්ත්‍රාත් පැකේජ දෙකක් (RT-1 සහ RT-6) අවම ප්‍රතිචාරාත්මක ලංසුකරුට කොන්ත්‍රාත් එකකට වඩා ප්‍රදානය කිරීමට නොහැකි වීමේ කොන්දේසිය හේතුවෙන් නැවත ලංසු කැඳවීමට සිදු විය. තවද, එම කොන්ත්‍රාත් පැකේජ දෙක 2022 මාර්තු 31 දින වන විටත් නැවත ලංසු කැඳවා ප්‍රදානය කර නොතිබුණි. එබැවින් අසාමාන්‍ය ලංසු කොන්දේසි වැඩසටහනේ සමස්ත කාර්ය සාධනයට සෘජුවම අහිතකර ලෙස බලපා ඇති බව නිරීක්ෂණය විය. | නැවත ලංසු කැඳවීමට ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය දැනටමත් පියවර ගෙන ඇත. ලංසු ලේඛන කැඳවීමට තා.ඇ.ක. නිර්දේශ කර ඇත. අ.ප්‍ර.ක. අනුමැතිය ඇතිව ලංසු කැඳවනු ලබන අතර ආසියානු සංවර්ධන බැංකුවේ එකඟතාවයද ලබා ගත යුතුය. | අසාමාන්‍ය ප්‍රමාදයන් සහ වැඩසටහනේ පිරිවැය වැඩිවීම වළක්වා ගැනීම සඳහා මුල් අවධියේදී කොන්ත්‍රාත්තුවේ කොන්දේසි ගැඹුරින් සමාලෝචනය කළ යුතුය. |
| (එ) | අසාමාන්‍ය ලංසු කොන්දේසි ක්‍රියාත්මක කරමින් ඌව පළාතේ අවලංගු කරන ලද කොන්ත්‍රාත් සඳහා නැවත ලංසු කැඳවීමේ ප්‍රමාදය, මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු | එවැනි මාර්ග නඩත්තු කිරීම සඳහා දරන අමතර වියදම එම මාර්ගවල අවලංගු කරන ලද කොන්ත්‍රාත් පැකේජවලින් අයකර ගනු ලැබේ. | නැවත ලංසු කැඳවීමේ ක්‍රියාවලිය පහසු කිරීම සඳහා අවලංගු කරන අවස්ථාවේ |

| | | | |
|---|---|---|---|
| | ක්‍රමාණුකූලව ක්‍රියාත්මක කිරීමට සෘජුවම බලපා තිබුණි. තවද, මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ විශේෂ කොන්දේසි 103.2 (2) අනුව, දැනට පවතින මාර්ගවල නිරන්තර නඩත්තු කටයුතු සඳහා ගෙවීම් අයිතමයක් ඇත. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළ හදිසි නඩත්තු කටයුතු ආවරණය කිරීම සඳහා රු. මිලියන 66.26 ක වටිනාකමකින් යුත් අතිරේක කොන්ත්‍රාත් පැකේජ 04 ක් ප්‍රදානය කර තිබුණු අතර එය පැහැදිලිවම වැඩසටහනට අතිරේක සහ ආර්ථික නොවන වියදමක් විය. | | කොන්ත්‍රාක් වටිනාකම දැනගැනීම කාර්යක්ෂමව කලයුතු අතර අනවශ්‍ය ප්‍රමාදයන් සහ වියදම් සීමා කිරීම සඳහා පිළිගත් කොන්ත්‍රාත් කොන්දේසි යටතේ නැවත ලංසු කැඳවීම ක්‍රියාවට නැංවිය යුතුය. |
| (ඒ) | ප්‍රසම්පාදන අත්පොතේ 7.9.2 වගන්තියට අනුව, අවම ප්‍රතිචාරාත්මක ලංසුව ඉංජිනේරු ඇස්තමේන්තු සැලකිය යුතු ආන්තිකයකින් ඉක්මවන්නේ නම්, ප්‍රසම්පාදන ආයතනය නව ලංසු කැඳවීමට හෝ ලංසුකරු සමඟ එකඟතාවයකට සාකච්ඡා කළ යුතුය. කෙසේ වෙතත්, සාකච්ඡා කරන ලද ලංසු මිල පවා ඉංජිනේරු ඇස්තමේන්තු වලට වඩා සැලකිය යුතු ලෙස වැඩි වූ අතර සියයට 32.8 සිට සියයට 39.7 දක්වා පරාසයක පැවතුණි. එබැවින් උතුරු පළාත් කොන්ත්‍රාත් පැකේජවලට අදාළව ඉංජිනේරු ඇස්තමේන්තු යථාර්ථවාදී ලෙස සකස් කර නොතිබීම හෝ මිල සාකච්ඡා නිසි ආකාරයෙන් සිදු කර නොමැති බව නිරීක්ෂණය විය. | ඉංජිනේරු ඇස්තමේන්තුව ම.ප්‍ර.රේ. භාවිතයෙන් සකස් කර ඇති අතර ග්‍රාමීය මාර්ග පිරිවැය ඇස්තමේන්තු කිරීම සඳහා ප්‍රායෝගික නොවේ. එබැවින් සම්මතයන් ඒ අනුව වෙනස් කළ යුතුය. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ දක්වා ඇති කොන්දේසි අනුව ඉංජිනේරු ඇස්තමේන්තු යථාර්ථවාදී විය යුතුය. |
| (ඔ) | උතුරු පළාතේ කොන්ත්‍රාත් පැකේජ 08 කදී එක් කොන්ත්‍රාත්කරුවෙකු අවම ප්‍රතිචාරාත්මක ලංසුකරු වූ අතර තා.ඇ.ක. හි ඇගයීමට අනුව, අදාළ කොන්ත්‍රාත් පැකේජ 08 සඳහා අවශ්‍ය සාමාන්‍ය වාර්ෂික ඉදිකිරීම් පිරිවැටුම (AACTO) රු. මිලියන 23,200 ක් විය. නමුත් සමාගමේ පවතින සාමාන්‍ය වාර්ෂික ඉදිකිරීම් පිරිවැටුම රු. මිලියන 22,700 ක් වූ අතර සමාගම පැකේජ 08 සඳහාම සුදුසුකම් ලැබීමට රු. මිලියන 500 ක හිඟයක් ඇති බව | සම්පූර්ණ කොන්ත්‍රාත් පැකේජ 08 ම අදාළ කොන්ත්‍රාත්කරුට ලබාදීමේ අවදානම ඉතා අඩු බව ව්‍යා.අ.ඒ. සහ තා.ඇ.ක. සඳහන් කර ඇත. තවද, නැවත ලංසු කැඳවීම හා සසඳන විට එය වාසිදායක විය. | ඇතැම් කොන්ත්‍රාත්කරුවන්ට අනවශ්‍ය අනුග්‍රහයක් දැක්වීම වැළැක්වීම සඳහා ලංසු තැබීමේ කොන්දේසි නොවෙනස්ව දැඩි ලෙස අනුගමනය කළ යුතුය. |

නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, තා.ඇ.ක. සහ අ.ම.ස්.ප්‍ර.ක විසින් ඉහත තීරනාත්මක නිර්ණායක සැලකිල්ලට නොගෙන ව්‍යාපෘති අධ්‍යක්ෂවරයාගේ අදහස් සැලකිල්ලට ගනිමින් සම්පූර්ණ පැකේජ 08 ම එම කොන්ත්‍රාත්කරු වෙත ප්‍රදානය කිරීමට තීරණය කරන ලදී. තවද, පැකේජ 08 හි ඇති මුළු මාර්ග 141 හි මුල් කොන්ත්‍රාත්තු කාලය සියයට 96 කින් අවසන් වී තිබුණද, මාර්ග 06 ක වැඩ ආරම්භ කර හෝ නොතිබූ අතර මාර්ග 84 ක භෞතික ප්‍රගතිය 2021 දෙසැම්බර් 31 දින වන විට සියයට 75 ට වඩා අඩු මට්ටමක පැවතුනි.

## 3.3 වැඩබිම් පරීක්ෂාවේදී සිදුකරන ලද නිරීක්ෂණ

| අංකය | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොන්ක්‍රීට් වැඩ, කාණු, මාර්ගය දෙපස සහ බෝක්කු යනාදිය සම්පූර්ණ කිරීමෙන් තොරව රු. 178,643,296 ක් වැය කරමින් CL-03 කොන්ත්‍රාත් පැකේජය යටතේ කි.මී. 32.85 ක් දිග මාර්ග ප්‍රදේශවල තාර අතුරා තිබුණි. එය තාර ස්ථරයේ ස්ථායීතාවයට අහිතකර ලෙස බලපෑ හැකි අතර ඉතිරි ඉදිකිරීම් සඳහා යන්ත්‍ර සූත්‍ර යොදා ගනිමින් සිදු කරන පස් කැණීම ද තාර ස්ථරය හානි වීමට හේතු විය හැක. | සමහර අවස්ථා වලදී, කොන්ත්‍රාත්කරු පසුකාලීන ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට අවශ්‍ය සම්පත් රැස්කර ගැනීමේ දුෂ්කරතාවන්ට මුහුණ දෙන අතර දැනටමත් අවසන් කර ඇති කටයුතු වලට හානි සිදු වේ. | කිසිදු ප්‍රමාදයකින් තොරව සම්පූර්ණ ඉදිකිරීම් ක්‍රියාවලිය සුමටව ක්‍රියාත්මක කළ යුතුය. |
| (ආ) | CL 03 කොන්ත්‍රාත් පැකේජය යටතේ තාර දැමූ ප්‍රදේශයේ කි.මී. 3.88 ක මාර්ග දෙපස කාණු, මාර්ගය දෙපස කි.මී. 26.97 ක් සහ බෝක්කු 13 ක් විගණිත දිනය වූ 2021 දෙසැම්බර් 16 වන විටත් නිම කර නොතිබුණි. | අනවශ්‍ය ව්‍යුහාත්මක කටයුතු හේතුවෙන් බොහෝ මාර්ග වැඩිදියුණු කිරීම් ප්‍රමාද වීම / දිගු කාලයක් ගත වන අතර මාර්ගය ඇතුලත ප්‍රදේශයේ ඉදිකිරීම් කටයුතු සඳහා ප්‍රමුඛත්වය දෙනු ඇත. | කිසිදු ප්‍රමාදයකින් තොරව සම්පූර්ණ ඉදිකිරීම් ක්‍රියාවලිය සුමටව ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඇ) | සම්මත පිරිවිතර 701.1 (ii) උප වගන්තිය අනුව මාර්ග භාවිතා කරන්නන්ට සිදුවන අපහසුතා අවම කිරීම සඳහා ඉංජිනේරුවරයාගේ උපදෙස් පරිදි කාණු ඉදිකිරීම් සිදු කළ යුතු වුවද, සමහර | සමහර හරස් කාණුවල කොන්ක්‍රීට් ආවරණ අතර පරතරය දක්වා ඇති සම්මත ඉඩ ප්‍රමාණයට වඩා වැඩි බව ඉංජිනේරු කාර්ය මණ්ඩලය ද | ඉදිකිරීම් වලදී සම්මත පිරිවිතර සමග දැඩි ලෙස අනුකූල විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | හරස් කාණුවල කොන්ක්‍රීට් ආවරණ දෙකක් අතර ඉඩ ප්‍රමාණය සම්මත ඉඩ ප්‍රමාණයට වඩා වැඩි බව නිරීක්ෂණය වූ අතර එය මාර්ගය දෙපස දේපල හිමියන්ට සහ මාර්ග භාවිත කරන්නන්ට විශාල අපහසුතාවයක් ඇති කළ හැකිවනු ඇත. තවද, 2021 දෙසැම්බර් 31 දිනට යකඩ සැකිල්ල සහ රාමුව ඇතුළුව මිලිමීටර් 150 ඝනකම පෙරසවි කොන්ක්‍රීට් ආවරණ සඳහා CL 03 කොන්ත්‍රාත් පැකේජයෙන් රු. 661,040 ක මුදලක් ගෙවා තිබුණි. | නිරීක්ෂණය කළහ. එය නිවැරදි කරන ලෙස කොන්ත්‍රාත්කරුවන්ට උපදෙස් දී ඇත. | |
| (ඇ) | කොන්ත්‍රාත්කරු විසින් රථවාහන හා තෙවන පාර්ශවයන්ගේ ආරක්ෂාව සඳහා අවශ්‍ය සියලුම සංඥා, ලාම්පු, බාධක, රථවාහන පාලන සංඥා මාර්ග සලකුණු ආදිය සවි කිරීම සහ නඩත්තු කිරීමද රාත්‍රී කාලයේදී මාර්ග බාධක අසල දීප්තිමත් රතු පහන් දැල්වීමට හෝ අනතුරු ඇඟවීමේ ලාම්පු මාර්ග බාධක මත සවි කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු වුවද, කොන්ත්‍රාත්කරු මෙම අවශ්‍යතා සපුරාලීමට අපොහොසත් වූ අවස්ථා නිරීක්ෂණය වූ අතර කොන්ත්‍රාත්තුවේ ව්‍යාපෘති ආරක්ෂණ කළමනාකරණ සැලැස්මේ 4.4 වගන්තිය සහ කොන්ත්‍රාත් විශේෂ කොන්දේසිවල පිරිවිතර 103 ට පටහැනිව එම අඩුපාඩු සඳහා අඩු කිරීමෙන් තොරව 2021 දෙසැම්බර් 17 දිනට රු. 6,279,196 ක මුදලක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා ඇති බව නිරීක්ෂණය විය. | සමහර මාසවල ප්‍රමාණවත් ආරක්ෂක පියවරයන් නොමැති වීම හේතුවෙන් ගෙවීම් අඩු කිරීම් සිදු කරන ලදී. ග්‍රාමීය මාර්ගවල පටු කොටස් හේතුවෙන් සමහර ස්ථානවල ආරක්ෂිත බාධක නඩත්තු කළ නොහැක. කෙසේ වෙතත්, ගැඹුරු කැණීම් සිදුකරන ස්ථානවල ආරක්ෂිත බාධක සහ ආලෝක පද්ධතියක් පවත්වා ගෙන ගොස් ඇත. | දැනට පවතින මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේදී කොන්ත්‍රාත්කරුවන් විසින් ක්‍රියාත්මක කරන ආරක්ෂිත පියවර සේවා යෝජකයා සහ උපදේශකයින් විසින් සමාලෝචනය කළ යුතුය. |
| (ඉ) | CL 01 කොන්ත්‍රාත් පැකේජය යටතේ දුරකථන සේවා සපයන කණු මාර්ගයෙන් ඉවත්කිරීමෙන් තොරව තාර දමා තිබූ අවස්ථා නිරීක්ෂණය වූ අතර එය විගණනයට ප්‍රශ්නගත විය. | කොන්ත්‍රාත්කරු විසින් මාරු කිරීමේ පිරිවැය ගෙවීමෙන් පසු ඔවුන්ගේ කාලසටහනට අනුව දුරකථන කණු මාරු කිරීම ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම විසින් සිදු කරනු ලබන අතර එම පිරිවැය සේවා යෝජකයා විසින් අතුරු ගෙවීම් සහතික මගින් ප්‍රතිපූරණය කරනු ලැබේ. | මාරුකිරීමේ කටයුතු වල ප්‍රමාදය වළක්වා ගැනීම සඳහා කොන්ත්‍රාත්කරු විසින් නියමිත වේලාවට ගෙවීම් කරන්නේ දැයි සොයා බැලිය යුතුය. |
| (ඊ) | කොන්ත්‍රාත් ගිවිසුමේ ව්‍යාපෘති ආරක්ෂණ කළමනාකරණ සැලැස්මේ 4.24 උප වගන්තියට අනුව, CL 01, CL 02 සහ CL 03 පැකේජවල මහජන පැමිණිලි 81 ක් සම්බන්ධයෙන් මාස 06 සිට වසර 01 කට වඩා වැඩි කාලයක් කටයුතු කර නොතිබුණි. | ඉදිකිරීම් කටයුතු සම්බන්ධ පැමිණිලි මාර්ග ඉදිකිරීමේ ප්‍රගතියට අනුකූලව විසඳනු ලැබේ. කෙසේ වෙතත්, මාර්ග භාරදීමට පෙර සියලුම පැමිණිලි විසඳනු ලැබේ. | පැමිණිලි විසඳීම කඩිනමින් සිදුකළ යුතුය. |

**3.4 පරිබාහිර ගෙවීම්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළදී ණය මුදලින් භාවිතයට නොගත් අරමුදල් මත ණය දෙන ආයතනයට රු. මිලියන 126.78 ක කැපකරු ගාස්තු අනාර්ථික ලෙස ගෙවා තිබුණු අතර 2021 දෙසැම්බර් 31 දිනට සමුච්චිත කැපකරු ගාස්තුව රු. මිලියන 576.30 ක් විය. | කැපකරු ගාස්තු ගෙවීම ආර්ථික නොවන ගෙවීමක් වුවද එය වැළැක්විය නොහැක. නමුත් වියදම් ඉලක්ක සපුරා ගැනීමෙන් එය අවම කර ගත හැක. | අනවශ්‍ය පිරිවැය අවම කිරීමට කටයුතු කළ යුතුයි. |

**3.5 මානව සම්පත් කළමනාකරණය හා සම්බන්ධ ගැටළු**

| විගණන නිරීක්ෂණය | තනතුරු සංඛ්‍යාව | | | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|
| | අනුමත | 2021 දෙසැම්බර් 31 දිනට තත්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | | |
| ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු | 6 | 1 | 5 | සමහර පුරප්පාඩු සඳහා ලේකම්වරයාගේ අනුමැතිය දැනටමත් ලබා දී ඇති අතර සමහර ඒවා ලැබීමට නියමිතව ඇත. තවද, සමහර අනුමත තනතුරු සඳහා සම්මුඛ පරීක්ෂණ මණ්ඩල පත් කරන ලද අතර සම්මුඛ පරීක්ෂණ නොපමාව පවත්වනු ලැබේ. | කාර්ය සාධනය උපරිම කිරීම සඳහා වැඩසටහන මඟින් ප්‍රශස්ත සේවක සංඛ්‍යාවක් පවත්වා ගත යුතුය. |
| සම්බන්ධීකරණ ඉංජිනේරු | 14 | 4 | 10 | | |
| ව්‍යාපෘති ඉංජිනේරු | 28 | 15 | 13 | | |

### 3.6 ව්‍යාපෘති අධීක්ෂණ ඒකකයට අදාළ ගැටළු

| ප්‍රධාන සේවක තනතුර | ව්‍යා.ක.ඒ. හි සේවා කාලය | වෙනත් ආයතන වල රැකියාවක සේවා නියුක්තිකයෙක්ද | සේවයේ නියුතු පදනම කොන්ත්‍රාත් පදනම මත/වැඩ බැලීමේ පදනම මත | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|
| ව්‍යාපෘති අධ්‍යක්ෂ (ඌව) | මාස 13 | ඔව් (මාර්ග සංවර්ධන අධිකාරිය) | වැඩබලන පදනම | මෙම දැන්වීම් දෙවරක් පලකර ඇති අතර වැඩබලන ව්‍යාපෘති අධ්‍යක්ෂ තනතුරට හැර අනෙකුත් තනතුරු සඳහා අවස්ථා දෙකේදීම අයදුම්පත් ලැබී නොමැත. | චක්‍රලේඛ උපදෙස් අනුව ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා සෑම විටම පූර්ණ කාලීන පදනමින් බඳවා ගත යුතුය. |

### 3.7 පද්ධති හා පාලන

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| වැඩසටහනේ පහසුකම් පරිපාලන අත්පොත සහ 2019 මාර්තු 05 දිනැති අංක. 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 9 වගන්තියට අනුව, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කටයුතු පාලනය කිරීම, අධීක්ෂණය කිරීම සහ සම්බන්ධීකරණය කිරීම සඳහා ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් අවම වශයෙන් කාර්තුමය වශයෙන් පැවැත්විය යුතුය. කෙසේ වෙතත්, 2021 වර්ෂය සඳහා එක් රැස්වීමක් පමණක් පවත්වා තිබුණු බව නිරීක්ෂණය විය. | මහාමාර්ග අමාත්‍යාංශ ලේකම්ගේ සභාපතිත්වයෙන් දුරස්ත ක්‍රමය යටතේ එක් රැස්වීමක් 2021 දෙසැම්බර් 16 දින පැවැත්විණි. | නියම කර ඇති ආකාරයට අනුව සියලු මෙහෙයුම් කමිටු ක්‍රියාත්මක කළ යුතුය. |